# ස.ණ.ස.
## පුවත් කොළඹින්

coop

2020 - ජනවාරි - පළමුවන කලාපය

දායකත්වය රු 15/-











# ධන බලය හා නිල බලය නැති ජනතාවට පිහිටවන සමුපකාරය ශක්තිමත් කිරීමට අවධානය යොමුවිය යුතුය.


සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය




වසර 180 කට පමණ පෙර සමුපකාරය අර්ථ ක්‍රමයක් ලෙසට ආරම්භ වූයේ සමාජ අසාධාරණයෙන් පීඩාවට පත් ජනතාවගේ අභිවෘද්ධිය සදහාය. එම සමුපකාරය මෙරට ආරම්භව වසර 113 ගතවී ඇත. සකසුරුවම හා ණය ගනුදෙනු නමින් බැංකු කටයුතු ඇරඹි සමුපකාරය පසු කළ ජනතාවට බලපාන සෑම ක්ෂේත්‍රයකම එනම් කර්මාන්ත, කෘෂි, පාරිභෝගික, අලෙවි, ධීවර, ආදී සෑම අංශයකට සංවිධානය වෙමින් ජනතාවගේ යහපත වෙනුවෙන් ඔවුන්ම කටයුතු කරති. ඉංග්‍රීසි යුගයේ සිට පැවති රජයන් එයට අනුබල දුන්නේ රජයක් විසින් සිදු කළ යුතු සේවාවවන් තමන් විසින් සිදුකරනු ලබන මහජන සංවිධානයක් නිසාය. එසේම එය දේශපාලනික හෝ ජාති හෝ ගෝත්‍ර වශයෙන් වෙනස්කමක් නොවන සියලු දෙනාටම එකට එක්ව කටයුතු කරන ස්වේච්ඡා සංවිධානයක් නිසාය. මෑත යුගවල සමුපකාරයට දේශපාලන පාක්ෂිකයින් පාලක මණ්ඩලවලට ඇතුළත් කිරීමේ නුසුදුසු ක්‍රියාවන් නිසා සමුපකාරය සාමාජිකයින්ගෙන් ඈත්වී ඇත. එය දේශපාලන පක්ෂවල බලය පෙන්වන කුඩා මැතිවරණයක් බදුවේ. මේ තුළින් පාලක මණ්ඩලවලට පත්වන්නන් සමුපකාරය පිළිබඳව අවබෝධයක් හෝ තම භාවිතාවන් පිලිබඳව වැටහීමක් හෝ නොමැතිව සාමාජිකයින්ගේ අදහස් නොසලකා කටයුතු කිරීමේ ප්‍රතිපලය වී ඇත්තේ සියලුම ප්‍රාදේශික සාමාජිකයින්ගෙන් ඈත්වීමයි. සෑම ප්‍රාදේශීකයක්ම සාමාජිකයාගේ බවට කාවදින වැඩ පිළිවෙලක් නොමැතිව වසර 3කට වරක් පාක්ෂිකයින්ගෙන් සමන්විත සීමිත මහාසභාවක් මගින් බලය අල්ලා ගැනීම තුළම ඇත්තේ සාමාජිකයාගෙන් ඈත්ව සිටීමේ ස්වභාවයයි. මේ නිසා සමුපකාර සැබෑ සාමාජික සංවිධානයක්ව කිසිදු භේදයකින් තොරව කටයුතු කිරීම සදහා වත්මන් රාජ්‍ය පාලකයන්ගේ අවධානය යොමුවී අත්‍යාවශ්‍යව තිබේ.

මෙරට සමුපකාරයෙන් ප්‍රයෝජන ගන්නා ලක්ෂ සංඛ්‍යාත වූ නිල බලය හෝ ධන බලය නැති ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ අවශ්‍යතාවය ඉටු කිරීමට නම් සමුපකාර සංවිධානවලට කිසිදු දේශපාලන ඇඟිලි ගැසීමකින් තොරව කටයුතු කරගෙන යාමේ පරිසරය ඇති කර දිය යුතුය. විශේෂයෙන් පාරිභෝගික සේවාව සම්බන්ධයෙන් ඇති වී ඇති මේ තත්වය වෙනසකට පත්වුවහොත් සමුපකාර සංවිධාන 308 ක් යටතේ රටපුරාවටම සෑම ගමක්ම ආවරණයවන පරිදි ඇති ප්‍රාදේශික වෙළඳ සැල් සාමාජිකයින්ගේ බවට පත්වෙමින් සිය අවශ්‍යතා එමගින් ඉටුකර ගැනීමේ හැකියාව ජනතාවට හිමිවනු ඇත. මේ තත්වයට පළාත් 7 කම නැති නිසා මේවන විට සමුපකාරය සාමාජිකගේ සංවිධානයක් ලෙස නොව රජය විසින් පාලනය කරන, රජය මගින් මැතිවරන පවත්වා පාලක මණ්ඩල පත්කරන සංවිධාන බවට පත්වී ඇත. මේ තත්වය නිසාම ලොව පිලිගත් සමුපකර ප්‍රතිපත්ති හෝ සාරධර්මවලින්


07 පිටුවට...


## සාමාජිකත්වය සිහිකිරීම වැලිවිටදී




පසුගියදා සී.ස. වැලිවිට අංක 01 සණස සමිතිය මගින් මියගිය සාමාජිකයින් සිහිකර සෑම වසරකම සිදු කරණු ලබන දිව්‍ය පුජාව මෙවරත් සිදු කරන ලදී. එම අවස්ථාවට දිස්ත්‍රික් සණස සංගම් ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩී. වීරසුරිය මහතාත් සහභාගී විය.

## නව අවුරුදු පැතුම

කිරි සුදු හිම ගඟුලැල්ද හැලෙන්නා
සිරි මල් හරිතව ගස් පූදින්නා
පෙරී පෙරී මී පැණි සුවඳ ගෙනෙන්නා
සරිකර කිරිබත සණස දිලෙන්නා

පවුලක එකමුතු බව දිස්වෙන්නා
වසරක ආලෝකය පැතිරෙන්නා
සිරිලක සණසට සිළුමිණ වැන්නා
විස්සක දෙදහස කිරි ඉතිරෙන්නා

පබඳුම - හේමසිරි බෙනරගම



## 2020 නව වසරට දියගම සණසෙන් පාසැල් උපකරණ




දියගම විහාරස්ථානයේ විහාරාධිපති දියගම ධම්මරක්ඛිත ස්වාමින්වහන්සේ විසින් පහවසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවෙකුට මුදල් ත්‍යාග පිරිනැමීම.

සී.ස. දියගම සණස සමිතිය මගින් සමිතියට අනුබද්ධ 'සෙත්සිරි' ළමා සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ දරු දැරියන්ට හා ගිණුම් හිමි දරු දැරියන්ට ත්‍යාග බෙදා දීම උත්සවාකාරයෙන් සිදු කෙරිනි. මෙම උත්සවය සාල වනෝද්‍යාරාම විහාරස්ථාන යේදී පවත්වන ලදී. ශ්‍රී, සාල වනෝද්‍යානාරාම විහාරාධිපති පූජ්‍ය දියගම රක්ඛිත ස්වාමීන් වහන්සේ, කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ හෝමාගම කලාපීය ගරු අධ්‍යක්ෂ එම්. ලයනල් ගුණරත්න මහතාගේ හා කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ දියගම පර්ෂද සම්බන්ධීකරණ නිලධාරී නිර්මදා ජිනාදරී වැලිකල මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

මෙදින 2020 නව පාසැල් වාරය වෙනුවෙන් දු දරුවන් 220 දෙනෙකුට පාසැල් අභ්‍යාස පොත් හා පාසැල් උපකරණ ලබාදීමද, 2019 වසරේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් ආර්.එම්. දේශික සංදීප හා පී.ජේ. සෙනුල් දම්සක් යන දරු දෙදෙනාට මුදල් ත්‍යාග


07 පිටුවට...

# සමුපකාරය නව ආරක් සඳහා



සමුපකාරයට තවත් නව වසරකි 2020. නව සිතුවිලි හා ආකල්ප මත සණස නවීකරණය විය යුතුව ඇත. මේ සදහා සමුපකාර සංවර්ධනය හා සන්නිවේදන තාක්‍ෂණයේ පිහිටෙන්, වර්තමානයේ කතාබහට ලක්වී ඇති, ගෝලීයකරණය විශ්ව ගම්මානය සහ මුළු මහත් ලෝකයම එකම පවුලක් යන සංකල්ප බිහිව ඇත.

සන්නිවේදනය, සංවර්ධනය සදහා යොදා ගන්නා වු ප්‍රධාන සාධකයකි. තාක්‍ෂණයේ දියුණුවත් සමග විවිධ සන්නිවේදන මාධ්‍යයන් සමාජගත වත්ම, එහි බලපෑම්ද දැඩිව ඇත. ආර්ථික ක්‍රමය තුළ වර්තමාන වෙළඳපොලට සන්නිවේදනයේ ඇති සුපිරි ශක්තිය ඇතිකරවීමට ප්‍රචාරණය හා දැන්වීම් බලපා ඇත. මිනිස් සිතුවිලි ජනමතය ඇති කරවීමට සන්නිවේදනයේ අති ශක්‍යතාව, ලොව සිතුම් පැතුම් හා ආකල්ප නිර්මාණවීමට සන්නිවේදනය මාධ්‍යයක් ලෙස භාවිතාවීම බලපෑම් ඇතිකර ඇත.

සමුපකාරයට වර්තමාන සන්නිවේදන මාර්ගයන් ඉතා අල්ප ලෙස මේවන විට යොදාගෙන ඇත. එහෙත්, ඒවා ප්‍රමාණවත් නොවන්නේ සමාජ රටාව, අනෙකුත් අංශයන් උද්දීපනය කරවමින් පෙරට පැමිණීමෙන් සමුපකාරය හත්තක් පොලොවෙන් මතු වෙද්දී හත්ත මත තිබෙන පස් ස්වල්පය සමග යටින් දිස්වෙන සුදු පැහැය සේය. සංවර්ධනය සදහා ඕනෑම ක්‍රමයක විශ්වාසය පිළිගැනීම හා ජනතා මනසෙහි බලපාන ආකල්ප ඉවහල්වේ. වත්මන් සමුපකාරය පිළිබදව ජනතා ආකර්ෂණය අවම වට්ටමක තිබීම නිසා සංවර්ධනයට පහසු කාර්යයක් නොවනු ඇත. එහෙත් වසර සියගණනක් ඉතිහාසය සමුපකාරයේ ශක්තිය මේ වන විට පෙන්වා තිබේ. යථාර්තය සමාජ ගතවෙමින් පවතින හෙයින් සමුපකාරයේ ඉදිරි ගමන්මග ශක්තිමත්ව ගොඩනගන්නට සන්නිවේදන ක්‍රමවේද භාවිතා කළ යුතුමය.

ලෝකයේ බොහෝ ආයතන මේවන විට, ආයතනය තුළ වෘත්තීමය සන්නිවේදන නිලධාරීන් පත්කර ගෙන ඇත. වර්තමානයේ පරිගණකය හා ජංගම දුරකථන සරල මෙවලම් සේය. සමුපකාරයට තාක්‍ෂණය හා සන්නිවේදනය පිටස්තරයකු නොකල යුතුය. ව්‍යවසායික තරඟ රටාවක සන්නිවේදනය ඈත් කලහොත් සමුපකාරය හුදකලා වනු ඇත. මෙවන් කරුණු සැලකිල්ලට ගැනීමේදී ලැබුවා වූ නව වසර ආරම්භයේදීම සමුපකාරයට ලැදී නායක මූලික කාර්‍යභාරය විය යුත්තේ සමුපකාර සංවර්ධනය සදහා සන්නිවේදන ක්‍රමෝපායන් භාවිත කිරීමට උපදෙස් හා මග පෙන්වීමයි.


## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
ලක්ෂ්මන් අමරතුංග

☆ **ප්‍රකාශන කමිටුව**
පියසීලි හේමලතා
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ
ලක්ෂ්මන් ගුණවර්ධන

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk


# කෘතවේදී පිංකම උන්දුරුගොඩදී

උන්දුරුගොඩ සමිතියේ නිර්මාතෘවරුන් සහ මියගිය සාමාජිකත්වය සිහිකිරීමේ අරමුණින් වාර්ෂිකව සිදුකරනු ලබන දානමය පිංකම පසුගියදා සමිති ශාලාවේදී පවත්වන ලදී.

සමිතියේ ගරු සභාපති කේ.කේ. වීරක්කොඩි මහතාගේ මුලිකත්වයෙන් සමිතියේ කාරක සභාව මෙහෙයවීමෙන් පවත්වන ලද මෙම පිංකම සදහා අවට සමිති සමුපකාරිකයින් පිරිසක්ද සහභාගි වන ලදී.

**වාර්තාව**
**එම්. රොහාන් ජේ. පෙරේරා**

# වාර්ෂික චාරිකාව 2019

සී.ස. උතුරු නවගමුව සණස සමිතියේ වාර්ෂික චාරිකාව පසුගියදා දෙවිනුවර, කතරගම දේවාලය, කිරිවෙහෙර වැද පුදා තණමල්විල වාර්‍යා සුපිරි හෝටලය වෙත පැමිණ විනෝදයෙන් ගතකර දෙවන දින රිදීගම නිදහස් සත්ව උද්‍යානය නරඹා මදූනාගල උනුදිය පොකුණු නරඹා සංඛපාල විහාරය වැද පුදා ගැනීමට යන ලදී.



සණස සමිතියේ වාර්ෂිකව සංවිධානය කරනු ලබන චාරිකාව සදහා සණස සමිති සාමාජික සාමාජිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන් සහභාගි වන අතර මෙම චාරිකාව සාමාජිකයින් 100 බැගින් සතිඅන්ත 08කදි අවසන් කරනු ලබයි.

# හඹා ගිය ඉලක්කය

අවුරුදු විසිපහකුත් මාස කිහිපයකට පෙර
ආවෙමි වැඩ බිමට ඉතා සුළු වැටුපකට
ගෙව්වේ මුළු තරුණ කාලයම
මහ මගට
ලැබෙන මුදල නොතකා
ආවේ වැඩ බිමට
ලබාගත් අධ්‍යාපනයෙන්
සමාජයට යම් සේවයක්
කල හැකිවීම
මගේ සතුට සේ සලකා
උදය, රෑ, දවාල නොසෙව්වෙමි
රෑ එලිවන තුරා ද ගත කලෙමි
ඉලක්කම් හරඹය සමග
එළි වු පසුද නැවත
යා යුතුය මගට බැස

අව්ව, වැස්ස, නොතකමින්
ඇල, දොළ ගංගා මැදින්
ගොඩවෙමින් කඳු මුදුන්
කඳු පල්ලන් ද බසිමින්
ඉලක්කම් හරඹ තුල
ඉලක්කය සොයා ගියෙමි

යම් යම් කාලවල දෙන ලද ඉලක්ක
හඹා යාමට හැකිවිය.
එවිට ඇතිවන සතුට
එහෙත් ඒ හඹා යන ඉලක්ක තුල
ජීවිතය නැමැති ඉලක්කය කොටුවිය සැමදාටම

තවද අප ඉදිරි ඉලක්කද හඹා ගොස්
ඒවා ලොකු ලොකු ඉලක්කම්වලින්
සාර්ථක කල යුතුය වැඩ බිම
එනමුත් අපගේ නතර වු ජීවිත ඉලක්කය
කවදා නම් නැවත
ගොඩ නගන්නට හැකි වේයිද?

**බී.කේ පද්මිණි**
**වැලිවිට දිවිතුර කලාපය**
**ගාල්ල දිස්ත්‍රික් සණස සංගමය**

# ඕල්කොට්තුමා

ඉස්කෝලෙ ගිය මුල්ම
දිනය මතකයි හොදට
සුදෝ සුදු ප්‍රතිමාව
ගැන අම්මා කීවා මට

දිග රැවුල මුහුණ වැසු
වටාපත වගේමය
මා දිහා බලා ඔබ
යන්තමට සිනාවිය

ඇමරිකාවෙන් එදා
ඇවිත් මාගේ රටට
කළ මෙහෙය ගැන අසා
කඳුළු ආවා ඇසට

උතුම් ගුණ නැණ පිරුණු
ඕල්කොට් මැතිතුමනි
ඔබේ සේවය දෙවැනි
මිහිඳු සම්දුට පමණි

**ඩබ්.එච්. මෙනුක මෙත්සිළු**
**වල්පොල රන්තරු ළමා සමිතිය**

# අප හැරදා නුඹ ගියත්..

සැමට රහසින්
පිටව ගිය ඔබ
දුකක් සිතලග
පුරවලා...
කදුලු නෙතුලග
මතක පෙරලයි
කදුලු කැට ගෙන අහුලලා....
සිතින් නොසැලෙමි
මතක අහුලමි
තුටින් නුඹ ගිය
දෙස බලා....
කදුලු අතරින්
ඉතින් බැසයමි,
කුලතුංග මැතිදුනි
ඔබට නිවනෙහි
පැතුමන් පතා....

**ලංකාද සිල්වා**
**සී.ර. පිටිපන නගරය සණස කලමණාකාරිනි.**

# ස.ණ.ස.
පුවත් කොළඹින්

2020 ජනවාරි කලාපය




## මූල්‍ය අක්‍රමිකතා හෙළිකරන
# වත්කම් බැරකම් ප්‍රකාශනය

ලියාපදිංචි සමුපකාරණය දෙන සමිතියක කාරක සභික ධුරය අහෝසිවන අවස්ථා 2ක් අතුරු ව්‍යවස්ථාවේ සදහන් කර තිබේ. එහි වගන්ති අංක 4.2.1 (ඔ) හි සදහන් පරිදි වත්කම් බැරකම් ප්‍රකාශනයක් ඉදිරිපත් නොකිරීම සහ 1973 සමුපකාර රීති මාලාවේ 21 වන වගන්තිය යටතේ පත්වී දින හතක් තුළ දිව්රුම් ප්‍රකාශයක් භාර නොදීම යන කරුණු මත කාරක සභිකයෙකුගේ තනතුර අහෝසි වන්නේය. තවද කාරක සභාවේ බලතල හා යුතුකම් යටතේ අතුරු ව්‍යවස්ථා වගන්ති අංක 4.4.23 කාරක සභාව යටතේ තැනැත්තා සෑම වසරකම මාර්තු 31 දිනට පෙර වත්කම් බැරකම් ප්‍රකාශයක් ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙකී වගන්තිය සපුරාලීමට අපොහොසත්වන කාරක සභිකයෙකුහට තවදුරටත් එකී තනතුර දැරිය නොහැකිවනු ඇත. එහෙත් ප්‍රායෝගිකව මේ වගන්ති ක්‍රියාත්මක නොවන බව දක්නට ලැබේ. මෙම වගන්තිය ක්‍රියාත්මකවීමෙන් තනතුර අහෝසිවූ කාරක සභිකයෙකු ගැන අසන්නට ලැබී නැත. නොයෙක් අවස්ථාවල මූල්‍ය අක්‍රමිකතා ගැන තොරතුරු සමුපකාර ක්ෂේත්‍රයේ අසන්නට ලැබේ.

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනතට අනුව, ජනාධිපති හැර සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අමාත්‍ය මණ්ඩලය පත්කල නිළධාරින්, අධිකරන සේවා සේවා කොමිසම පත්කළ නිළධාරින්, මාණ්ඩලික නිලධාරින්, අධිකරන සේවා කොමිසම පත්කළ නිළධාරින්, මාණ්ඩලික නිලධාරින්, ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරන සදහා ඉදිරිපත්වන අපේක්ෂකයන්ද, නිලධාරින්ද ඇතුළු රාජ්‍ය සංස්ථා ආදි ඉහල තනතුරු දරන පුද්ගලයින් මේ පනතට යටත්වේ. කෙසේ වුවද සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ නිලතල උසුලන ස්වෙච්ඡා නිලධාරින්ට මේ පනත අදාල වනබව පනතේ සදහන් කර නැත. වත්කම් හා බැරකම් යන්නෙන් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිට ඇති සියලුම නිශ්චල, චංචල දේපල අදහස් කරනු ලැබේ. ප්‍රකාශකයා, කලත්‍රායා සහ අවු 18ට අඩු අවිවාහක දරුවන්ද ප්‍රකාශයට, ඇතුලත් කල යුතුය. මුදල් ස්වර්ණාභරන ව්‍යාපාර, ඉඩකඩම්, ලැබිය යුතු ණය, ගෙවිය යුතු මුදල් ඇතුලු සියලු වත්කම් බැරකම් ප්‍රකාශ කර, එය සමාදාන විනිශ්චයකරුවකු ලවා සහතික කරගත යුතු අතර, නියමිත දිනට පෙර මුද්‍රා තබා අදාල නිලධාරියාට භාරදිය යුතුවේ. ප්‍රමාද කිරීම, තොරතුරු සැඟවීම අසත්‍ය ප්‍රකාශ කිරීම, තොරතුරු ලබා නොදීම, සම්බන්ධව නඩු පවරා දඩුවම් කළ හැක. අල්ලස් හෝ දුෂණ චෝදනා විමර්ශන කොමසාරිස්වරයා ප්‍රමාද කරන වාර්තා සම්බන්ධව දඩ මුදල් නියම කර තිබේ.

ආදායම් වාර්තා ඉදිරිපත් නොකළ හිටපු දේශපාලනඥයෙකු වරද පිළිගැනීමෙන් පසු රු දහසක දඩයකට යටත්විය. එය වරදට ප්‍රමාණවත් නොවන බවට ජනමතයක් ගොඩනැගුණි. රංජන් කනගසබේ නඩුවේදි අදාල වාර්තා නිසිපරිදි රැස්කර නොතැබීම මත චුදිතයා නිදහස ලැබීය. හිටපු අග විනිසුරුවරියට එරෙහි නඩුවේදි අක්‍රිය ගිණුම්වාර්තා හෙළි නොකිරීම වරදක් නොවන බවට තීන්දුවිය. හිටපු එක්තරා අමාත්‍යවරයෙකු මාස 36ක් තුල උපයාගත් රු කෝටි 44.5 ක මුදල උපයාගත් ආකාරය හෙලි කිරීමට අපොහොසත් වු බැවින් ඔහුට විරුද්ධව නඩුවක් විභාග වෙමින් පවතී. තවද අමාත්‍යවරයෙකු විසින් උපයාගත් රු කෝටි 7 ක මුදල ඉපයු ආකාරය හෙළි කිරිමට අසමත්වීම නිසා නඩු පවරා ඇත. ලෝකයේ බොහෝ රටවල දේශපාලනඥයින් තම වත්කම් තොරතුරු සඟවද්දී පකිස්ථානයේ ඇගමැති පත්වු වහාම සිය වත්කම් බැරකම් අන්තර්ජාලය හරහා හෙළිකිරිම යහපත් ආදර්ශයකි. බරපතල වංචා සහ මූල්‍ය අක්‍රමිකතා වැලැක්වීම සදහා මෙම පනත මෙන්ම, තොරතුරු දැනගැනීමේ පනතද ඉවහල් වනු ඇත. මුදලක් ගෙවීමෙන් ඕනෑම පුරවැසියෙකුට මෙම තොරතුරු ලබාගැනීමේ අයිතියක් ඇත. එය ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සමාජයක පවතින උසස් ගුණාංගයකි.

**යු.ඩී.එස්. වීරසිංහ**
**නැ.ඇරැව්වල අංක 2**

## ළමා ආරක්ෂාව හා ළමා සංවර්ධනය පිළිබඳ
# දැනුවත් කෙරේ...

වර්තමානයේ දරුවන්ට මුහුණ පෑමට සිදුවී ඇති ගැටළු මෙන්ම ළමා සංවර්ධනයට ඇති බාදාවන්, දරුවන් කෙරෙහි ආදරය, ආරක්ෂාව හා රැකවරණය දරුවන් වෙත ලබාදෙමින් සුරක්ෂිත දරු පරපුරක් ඇති කර ගැනීම සදහා 'ළමා ආරක්ෂාව හා ළමා සංවර්ධනය' මැයෙන් සී.ස. දියගම සණස සමිතියේ සාමාජික සාමාජිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගියදා පවත්වන ලදී.

දියගම සණස සමිතිය මගින් විවිධ සමාජ සත්කාරක වැඩසටහන් මෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන්ද රාශියක් ක්‍රියාත්මක කරනු ලබන අතර ඊට සමගාමීව මෙම වැඩසටහන සංවිධානය කෙරිණ.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහනට සම්පත් දායකත්වය ලබාදෙන ලද්දේ හෝමාගම ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනී තේජන්ති වීරසේන මහත්මිය විසිනි.



**හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනී තේජන්ති වීරසේන මහත්මියව ගරු උපසභාපතිතුමා සභාවට හදුන්වා දෙමින්**

**චමිලා ජයතුංග -දියගම - ලේකම්**

## බටහිර ඉඳිබැද්ද සමිතියේ
# 27වන සංවත්සර සැමරුම

බටහිර ඉදිබැද්ද සණස සමිතිය 27 වන සංවත්සර උත්සවය පසුගියදා සණස රැස්වීම් ශාලාවේ උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණි.

එදින ප්‍රධාන ආරාධිතයන් ලෙස කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමයේ පර්ෂද කළමණාකාරිනි කමනි සමන්ලතා මහත්මිය, මොරටු කලාපීය අධ්‍යක්ෂ සුනිල් ප්‍රියලාල් මහතා සහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරින් දෙපලක්ද, නැ.ඉදිබැද්ද, බ.විල්ලෝරාවත්ත, නැ. විල්ලෝරාවත්ත යන අසල්වාසී සමිතිවල ගරු සභාපති මහත්මා මහත්මීන්ද ඒ අවස්ථාව සදහා සහභාගි විය.

මෙදින උත්සවය ළමා සමිතියේ දැරියන්ගේ නර්ථන අංගයන්ගෙන්ද අලංකාරමත් වු අතර සාමාජිකයින් සදහා විශේෂ ත්‍යාගද පිරිනමන ලදී. තවද නව නිළධාරී මණ්ඩලය පත්කර ගැනීමද මෙදින සිදුකරන ලදී.



**සටහන - කළමණාකාරිනී**

# සෙනෙහස

ඉදුනිල් ගුවන් තලේ
ගිරිකුළු අතරින්
හිරු දෙවියන් එන්නේ
මුළු තැන්ගෙට අම්මා

නික්මෙන අතරේ
ගිනි හුළ දෑතට ගෙන
වැව් තාවුල්ලට යන මගදි
මඟ හිඳ වයති

රස ගී බිඟු රැළ
ගුම් ගුම් නද දී
ගිනි දෙවියන් පුදමින්
ලිප් ගිනි මොලවන්නේ

හිරිමල් උදයේ
සිනා රැලි විඳිමින්නේ
මෙයයි සෙනහස
අම්මාගේ

**ප්‍රසාදිනී ජීවන්ති මිය**
**වල්පොල සණස**

# සමුගන්න හිත දෙන්න මැතිඳුනේ

වසර 20ක් පුරා අඛණ්ඩව පිටිපන නගරය සණස සමිතියට, ගරු සභාපතිතුමා ලෙස උත්තුංග මෙහෙයක් සිදු කල සාමවිනිසුරු ජී.ඩී. කුලතුංග මැතිතුමා, වසර 64ක ආයුකාලය නිමා කරමින් පසුගියදා අප අතරින් සමුගන්නා ලදී. එම දීර්ඝ සේවා කාලය තුල, පිටිපන නගරය සණස සමිතියේ උත්තරීතර කාර්යභාරයන් අවංකව, අපක්ෂපාතීව ඉටුකරලන්ට ඔහු ගත් කැපවීම කාටත් ආදර්ශයක් වනු ඇත.

**සාමවිනිසුරු ජී.ඩී. කුලතුංග මැතිතුමනි.**
**ඔබතුමාට නිවන් සුව අත්වේවා...**



**ලක්ෂ්මන් ගුණවර්ධන පිටිපන නගරය සණස වාර්තාකරු**

# අවුරුදු පැතුම

තුරුහිස් නමා එන මදනල සුවඳ දැනේ
ගෙන්ගෙට සිනා මුව හසරැල් මැවෙනු පෙනේ
වසරින් වසරක් නිමවී සුභ සතුට ගෙනේ
අවුරුදු කුමරියේ වඩිනු මැන සුභ පැතුම් ගෙනේ

**ප්‍රේමලතා වනිගසේකර**
**හෝ. කලාපයේ අධ්‍යක්ෂිකා, කාන්තා කමිටුවේ ලේකම්**

## ජීවී - අජීවී වෙනස

ධන අග්‍ර සෘණ අග්‍ර එකතුකර - සකසලා
අපූරුයි ඔබ ලොවට - ලබාදුන් දායාද
අඳුර නැති කරවන්න - දසත එළි විහිදන්න
විදුලි බල්බය ඔබ - කල මෙහෙය අපූරුයි

උදයවරු සවස්වරු - කාලයත් ගතවෙලා
හිරු එළියේ ප්‍රභාවත් - ටිකින් ටික අඩුවෙලා
හිරුගේ යුතුකම නිමාකර දැන් - බටහිරින් නොපෙනී ගියා
අඳුර ලොව රජවුනා - බල්බයත් දැල් වුණා

නිවෙස් මහ මග - කම්හලෙත් ඔබ අඳුරු දුරලා කරපු සේවය
අගය කරලා සබඳ ඔබහට - විවේකය දැන් ලබා දෙන්නට
නැගෙනහිරු, නැඟ එනතුරා - අප බලා සිටියා ඒ දෙසා
ලංවුනා බල්බය වෙතට අප - විවේකය ලැබ ගන්නටා

හිරු කුමරු නැගිටලා - අහස් කුස එළිවෙලා
නැගෙනහිරු දෙස බලා බලා අප - නිවයි බල්බය මේ ලෙසා

ගස්වැල්ද සිනාසේ - විහඟුන්ගේ හඩ නැගේ
දවසේ වැඩ ඇරඹේවී - හිරු එළිය පැමිණිලා

බල්බයේ, බල්බයේ - කිමද අද එළිනැත්තේ
හැකියාව නැත ඔබට - දසත එළි විහිදන්න
ධන අග්‍ර - සෘණ අග්‍ර - එකතුකර සැකසුවත්
ඇයිද අද - ඔබ නිහඬ සබඳ ඔබ මිය ගිහින්

අර බැනර් මේ බැනර් - ගුණ කථන මුකුත් නැත
පිච්චිලා, පිච්චිලා පිච්චිලා
බල්බය පිච්චිලා

**නිර්මාණය : හේමසිරි රණතුංග ආරච්චි**
**වැලිවිට මාලබේ සණස භාණ්ඩාගාරික**

## කඨින පිංකම්
# ධර්මදේශනය

දියගම ශ්‍රී සාල වනෝද්‍යානාරාම විහාරස්ථානයේ වාර්ෂික කඨින පිංකම නිමිති කරගෙන පවත්වනු ලබන පිංකම් මාලාවට සමගාමීව සීමාසහිත දියගම සණස සමිතිය මගින් වාර්ෂිකවම ධර්මදේශනා පිංකමක් සංවිධානය කරනු ලබනඅතර 2019 වසරේ කඨින පිංකම වෙනුවෙන් සංවිධානය කරන ලද ධර්ම දේශනය පසුගියදා දියගම ශ්‍රී සාල වනෝද්‍යාරාම විහාරස්ථානයේදී පවත්වනු ලැබීය. මෙදින දේශකයාණෝ වුයේ පලන්නොරුව ශ්‍රී විජය සුන්දරාමාධිපති පලන්නොරුව මධ්‍ය මහා විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය ශාස්ත්‍රපති පුජ්‍ය දියගම අභය බුද්ධි ස්වාමීන් වහන්සේය.

ධර්ම ශ්‍රවනය සදහා සණස සමිතියේ සාමාජික සාමාජිකාවන් ඇතුළු ප්‍රදේශවාසීන් විශාල පිරිසක් එක්වූහ.



**ස්වාමීන් වහන්සේට ගරු සභාපති ඩී. අමරතුංග මහතා විසින් අටපිරිකර පූජා කිරීම.**

**චමිලා ජයතුංග දියගම සණස ලේකම්**

# අත මිටිමොලවාගත නොහැකි
## හිරුඑළිය හා සුළඟ



හිරු එළිය, සුළඟ, පෘතුවිතලයට ස්වාභාවිකව ලැබෙන දේවල් බව අපි දනිමු... හිරු එළිය, සුළඟ අපට අතින් අල්ලල අරගෙන භාජනයකට බහා ප්‍රමාණාත්මකව පෙන්විය හැකි දෙයක් නොවේ. එහෙත් මේ හිරු එළියත් සුළඟත් නිසා මේ පෘතුවිතලය තුල විශාල වෙනස්කම් රැසක් සිදුවෙනවාද?

අපි හිතලා බලමු හිරු එළිය ගැන සාමාන්‍යයෙන් දෛනිකව උදැසන 5 න් පසුව හා 6.30 ට පෙර පෘතුවිතලයට හිරුඑළිය පතිතවෙනවා. එහිදී මිනිසාගේ ශරීරයට උදෑසන හිරුඑළිය පතිතවීම නිසා මිනිස් සිරුරේ ඩී විටමින් නිෂ්පාදනය කරනවා. මුදල් නොගෙවා වෙහෙස මහන්සි නොවී ඩී විටමින් යම් ප්‍රමාණයක් මිනිස් සිරුරට ලබාගත හැකි නම් කෙතරම් වාසිදායකද? මෙය උදැසන 8.30 පමණ වන තුරු හිරුඑළිය තුලින් ලබාගන්න පුළුවනි. ගහකොල ජීවය රදා පවතින්නත් හිරුඑළිය අත්‍යවශ්‍යයි. දිනය ටිකෙන් ටික පසුවෙද්දී දැඩි හිරු රශ්මියක් ලැබෙනවා. මෙය සමහර වෙලාවට මිනිසාට මෙන්ම සතා සිව්පාවාටවත් විද දරා ගැනීමට නොහැකි තරම්. එවන් අවස්ථාවල මිනිසාට මෙන්ම සතා සිව්පාවාට වුවත් සෙවණක් සොයා ගොස් දැඩි හිරු රශ්මියෙන් මිදෙන්න පුළුවන්. සමහර විට ඒ සෙවණ දෙන තැනක ගසක් යට වෙන්න පුළුවන්. එනමුත් එම ගස වගේම කිසිදු ගසකට පුළුවන් කමක් නැහැ. දැඩි හිරු රශ්මිය තිබෙන වෙලාවට ගසක් යටට හෝ සෙවණක් ලබාගන්න යන්න. ඒ නිසා මෙවන් වෙලාවට ගහ කොළ අතුඉති මෙන්ම මුළු ගසම මලානික වී ගහ දුර්වල වෙනවා. දිගින් දිගටම එසේ වන්නේ නම් සමහර ගහ කොළ සම්පූර්ණයෙන්ම විනාශ වී යාමට පුළුවන්. තවත් විටෙක මේ ගහකොළ පෘතුවිය මත ඇතිතාක් අව්වට වේලෙමින් සුළඟට සෙලවෙමින්, වර්ෂාවට ප්‍රබෝධමත් වෙමින්, විවිධාකාර වු කටුක අත්දැකීම් රාශියක් විද ගනිමින් ඒවාට ඔරොත්තු දෙමින් කාලයක් ගතවනවිට මහා රූස්ස ගසක් බවට පත්වන අවස්ථා ද නැතුවා නොවේ.

සමහර අවස්ථාවල මේ පෘතුවිය. තුල ජීවත්වන මිනිසුන් මෙන්ම පෘෂ්ඨීමත්ව ජීවත්වන අලියන් පවා දැඩි හිරු රශ්මිය නිසා මරණයට පත්වු අවස්ථා දැකිය හැකිවිය. එහෙත් මෙසේ හිරු රශ්මිය වැඩිවීම නිසා මෙලෙස කුමන සිද්ධියක් සිදු වූවද වැඩි වු හිරු රශ්මිය නැති දිනකට ගැනීම සදහා පරිස්සම් කර භාජනයක බහා තබා ගත හැකි දෙයක් නොවේ.

සුළඟද එසේමය. පෘතුවියේ ජීවත්වන ගහකොළ මෙන්ම, මිනිසාටද වෙනත් සත්වයාටද අත්‍යාවශ්‍ය දෙයක් තමයි මේ සුළඟ. සුළඟ හැමීම තුලින් වෙහෙසට පත්ව සිටින මිනිසාට මෙන්ම සත්වයාටද සෑහෙන සැහැල්ලුවක් ශරීරයට දැනෙනවා. එහෙත් සමහර අවස්ථාවල මේ සුළඟ විවිධ විධියට හමා ඒම නිසා ඒ තුලින් විශාල හානිදායක සිදුවීම් ද අපට දැක ගත හැකිය.

සුළඟ, මඳ සුළඟ, කුණාටු, සුලි කුණාටු, ටෙනාඩෝ, කම්මුරි ආදී වශයෙන් විවිධ තරාතිරමේ සුළං තත්ව ඇතිවිය හැකියි. මේ සුළං තත්වයන් ගත්විට මිනිස් සිරුරට ඉතා සැහැල්ලුවක් ගෙන දෙන අවස්ථා තිබෙනවා. තවත් විටෙක පොළව මතුපිට දුවිලි ගසාගෙන යනවා. ගස්වල කොල ගැලවී යනවා. ගස්වල ඉති අතු කඩා වැටෙනවා. විශාල ගස් මුලින්ම ගැලවී වැටෙනවා. නිවාස වල වහලයන් ගැලවී යනවා. නිවාස සම්පූර්ණයෙන් ගැලවී යනවා. වාහන පවා සුළඟේ පාවී යන අවස්ථා අපට දැකගත හැකි වෙනවා මෙවැනි විශාල පීඩාවක් සිදු වුනත් සුළඟ නිසා වැඩිපුර හමායන සුළඟ පසුව අපට අවශ්‍ය වෙලාවකට ටික ටික ගන්න පුළුවන කියල පෙට්ටියක දලා තියාගන්න පුළුවන්කමක් නැහැනේ.

මේ හිරු එළියත්, සුළඟත් දෙකම පෘතුවියේ පැවැත්මට ඉතාමත් අඟනා මෙහෙවරක් සිදුකරන අතර මේ කුමන දෙයක වුව වැඩිවීම පෘතුවිතලයේ මතුපිටට අන්තරායකාරී තත්වයන් ඇති වන්නටත් පුළුවන්. ඕනෑම දෙයක් ඕනෑවට වඩා ඕනම නැහැ කියල කියමන සනාථ වෙනව මේ වගේ දේ තුලින්.

**බී.කේ. පද්මිණි වැලිවිට දිවිතුර කලාපය -කළමණාකරු**

## වාර්ෂික ළමා සමාජ චාරිකාව

ලෝක ළමා දිනයට සමගාමීව සී.ස. පැපිලියාන සණස මගින් වාර්ෂිකව ළමා චාරිකාව මෙවරත් සිදුවිය. පිපෙන කැකුළු ළමා සමාජය දරුවන් චාරිකාව සදහා සහභාගි විය. ගාලුකොටුව, කැස්බෑවුන් සංරක්ෂණය, මාටින් වික්‍රමසිංහ ගම්මානය යන ස්ථාන නැරඹීය. කාන්තා කමිටුව විසින් මෙය සංවිධානය කරන ලදී.



**එච්.එම්. සසිකා ගයාන් පෙරේරා - පැපිලියාන සණස**

# බෝ නොවන රෝග පිළිබඳ සමීක්ෂණ වැඩමුළුව

ශිරන්ති ශ්‍යාමලි පෙරේරා - සී.ස. මහරගම සණස

*පෙර කලාපයෙන්.....*

පිරිසිදු ජලය පානය කිරීම ඉතා වැදගත් වන අතර ශරීරයේ පරිවෘතිය ක්‍රියා හොඳින් සිදුවීමටද විජලනය වැලැක්වීම ද එමගින් සිදුකරයි. විරලනය මගින් තාවකාලිකව අඩු රුධිර පීඩන තත්වයන් ඇති කලද එම තත්වය, ජලය පානය කිරීමෙන් ඉක්මණින් මගහැරී යයි. එය භායානක තත්වයක් නොවන බව වෛද්‍යවරුන්ගෙන් දැනගතිමු.

කඩල, කව්පි යනාදියේ ප්‍රෝටීන් වලට අමතරව කාබොහයිඩ්රේට ඇත. කිරි විදුරුවක, ප්‍රෝටීන් වලට අමතරව කාබොහයිඩ්රේට ඇත.

පොල්තෙල් වල සංතෘප්ත මේදය අඩංගුවේ. අසංතෘප්ත මේදය අඩංගු වන එළවළු තෙල් හා ඔලිව් තෙල් ආහාරයට ගත්විට තාපයෙන් හැඩය වෙනස් වී ට්‍රාන්ස් ෆැට් මේදය බවට පරිවර්තනය වේ.

මෙසේ අසංතෘප්ත මේදය අඩංගු ආහාර වර්ග පරිභෝජනය කලහොත් බෝ නොවන රෝග ඇතිවීමේ අවදානම වැඩිය. කාබෝහයිඩ්රෙට ඒකක 1ක් ග්‍රෑම් 15 ක් ලෙස සැලකේ. බත් කෝප්ප 1ක් ග්‍රෑම් 30 ක් ලෙස සැලකේ.

**බත් කෝප්ප 01ට සමාන වන ආහාර ප්‍රමාණ**

| | |
|---|---|
| ඉඳිආප්ප 04 | පාන් පෙති 02 |
| රොටි 01 | පිට්ටු 01 (4'' ප්‍රමාණයේ) |
| මුං ඇට 01 (කෝප්ප) | ආප්ප 02 |
| නූඩ්ල්ස් 01 (කෝප්ප) | පැස්ටා 01 (කෝප්ප) |
| තොසේ 01 | ඉටලි 01 (කෝප්ප) |

**ප්‍රෝටීන් සහිත ආහාර**

බිත්තර, මස්, මාළු, සෝයා, සෝයා බෝංචි, බෝංචි ඇටවර්ග වන මුංඇට, කඩල, කව්පි, පරිප්පු යනාදිය හා කිරි, කජු, රටකජු, බත් යනාදිය වේ.

බිත්තර 1 ක ප්‍රෝටීන් ග්‍රෑම් 7 ක් අඩංගුවේ. දිනකට ගන්නා ප්‍රෝටීන් ප්‍රමාණය ශරීරයේ බර සඳහා බලපායි.

අඩු පෝෂණය මෙන්ම අධික පෝෂණයද ශරීරයේ ස්ථූලතාවයට, පරිවෘතිය සංකූලතාවයට, නිදන්ගත රෝග වලට, අධි රුධිර පීඩන තත්වයන්ට, අධික ලෙස කොලොස්ටරෝල් ඇතිවීමට දියවැඩියා තත්වයන් මෙන්ම අඝාතය වැනි මොලයේ ද ශරීරයේ විවිධ අවයන් හි සංකූලතා ඇතිවීම කෙරෙහි බෙහෙවින් බලපෑම් ඇති කරයි.

එමනිසා දියවැඩියා තත්වය හා කොලොස්ටරෝල් අධික ලෙස තැන්පත් වීම වැලැක්වීම මගින් ශරීරයේ සමබරතාවය පාලනය වන අතර එමගින් බෝ නොවන රෝග වැලැක්වීමට, එය මහත් පිටිවහලක් වේ.

වසරකට සුදුසු වාර ගණනක්, නිවැරදි ලෙස ලේ පරීක්ෂා කිරී මගින් ශරීරයේ ඇති, රුධිර ගත හෝ මුත්‍රා ගත සීනි ප්‍රමාණය ද හෘද වස්තුවේ නාලවල තැන්පත් වන මේද ප්‍රමාණය ද දැනගත හැකිවේ. මෙහිදී වෛද්‍යවරුන් විසින් තීරණය කරන ආකාරය ට හා, ලබාදෙන උපදෙස් අනුව බෙහෙත් වර්ග ගතයුතු අතර, ව්‍යායාම කිරීම අතිශයින් වැදගත් වේ.

බෙහෙත් වර්ග ගැනීමෙන් ආකාර තුනකට ලෙඩ රෝග පාලනය කරගත හැකිවේ. එනම්,

1 ප්‍රාථමික අවස්ථාවේ වලක්වා ගැනීම.

2. ද්විතීයික අවස්ථාවේ වලක්වා ගැනීම

3. තෘතීයික අවස්ථාවේ වලක්වා ගැනීම යනුවෙනි.

බෙහෙත් ගන්නා ආකාරය පිළිබඳ හොඳ දැනුමක්, දේශණ පැවැත්වූ වෛද්‍යවරුන් විසින් ලබාදුනි.

බෙහෙත් ගන්නා මාත්‍රාව, ලෙඩ සුවකර ගැනීමට බෙහෙවින් බලපාන බව දැනුවත් කරනු ලැබුවා. ඒ සඳහා පහත සදහන් කරුණු වැදගත් වේ.

1. බෙහෙත් ගන්නා ආකාරය
2. බෙහෙත් ප්‍රමාණය
3. බෙහෙත් ගන්නා වේලාව
4. බෙහෙත් වර්ග
5. බෙහෙත් ගන්නා ධාරිතාව

මෙම කරුණු බෝනොවන රෝග වැලැක්වීමට ඉතා වැදගත් බව එම වෛද්‍යවරු අවධාරණය කලා. මෙහිදී අධික ලෙස ලුණු භාවිතය හා අධික ලෙස සීනි භාවිතය නොකල යුතු බවට අප දැනුවත් වූවා. දිනකට ලුණු තේ හැඳි 1 ක් පමණ පරිභෝජනයට කලයුතු අතර, සීනි ප්‍රමාණය විය යුත්තේ දිනකට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 10%කි.

උදා : දිනකට කැලරි 2000ක් පරිභෝජනයක් අවශ්‍ය කෙනෙක්ට, 10% ක් එනම් කැලරි 200 ක සීනි ප්‍රමාණයක් අවශ්‍ය වේ. එනම් සීනි ග්‍රෑම් 50ක් හෝ තේ හැඳි 12ක් අවශ්‍යවේ.

කැලරි ප්‍රමාණය 4 න් බෙදු විට අවශ්‍ය ග්‍රෑම් ගණන වන්නේ ග්‍රෑම් 50 කි. එය නැවත 4න් බෙදු විට අවශ්‍ය තේ හැඳි ගණන ලැබේ.

දිනකට ඔබට අවශ්‍ය කැලරි ප්‍රමාණය අනුව, දිනකට නියමිත සීනි ප්‍රමාණය, තේ හැඳි 6 සිට තේ හැඳි 15 දක්වා, අතර මට්ටමක පවතී. බොහෝ දෙනෙක් ට මෙම ප්‍රමාණයන් ගැනීම සුදුසු වේ.

මෙසේ සීනි හා ලුණු පාලනය කිරීම මගින් බොහෝ දුරට බෝනොවන රෝග, වැලදීම අවම තත්වයකින් පවත්වා ගත හැක.

*ඉතිරිය පසු කලාපයට*

## සී.ස. පැපිලියාන සණස

### වෛද්‍ය සායනය





වාර්ෂිකව නොමිලේ පවත්වනු ලබන වෛද්‍ය සායනය මෙවරත් පවත්වන ලදී. මෙහිදි සියළු සාමාජිකයන්ගේ දියවැඩියාව, කොලොස්ටරෝල්, රුධිර පීඩන හා බාහිර රෝගි පරීක්ෂා කල අතර විටමින් වර්ග හා බෙහෙත් ද නොමිලේ ලබාදෙන ලදී. ගරු සභාපති සුජිත් කුමාර මහතාගේ මුලිකත්වයෙන් එය පවත්වන ලදී. එහි අරමුණ වුයේ සාමාජිකයන්ගේ නිරෝගිභාවය පවත්වාගෙන යාමයි. රසවත්වු සංග්‍රහයක්ද පවත්වන ලදී. අප සමිතියේ නිතීඥවරිය වන සුරංගි බස්නායක මහත්මිය හා එතුමියගේ ස්වාමිපුරුෂයා වන ඩී.ජී.එස්. සියඹලාපිටිය වෛද්‍යතුමා වෛද්‍ය සායනයට දායකත්වය දක්වන ලදී. ඊට ස්තුතිය පුද කරමු.




**එච්.එම්. සුසිකා ගයානි පෙරේරා - පැපිලියාන සණස**

## වැඩිහිටි ප්‍රණාම

ඔක්තෝම්බර් මස 06 වන ඉරුදින පානලුව සණස සමිතියේ වයස අවු 70ට වැඩි සාමාජික මහත්ම මහත්මීන් ඉතා ගරු සරු ඇතිව පිළිගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරීන් විසින් කෙටි නට්‍යයක් ඉදිරිපත් කර නැටුම් හා ගීත ගායනා විවිධ තරඟ ඉදිරිපත් කරමින් සියල්ලන්ව ප්‍රබෝධමත් කලේය.

**ප්‍රියානි - ලේකම්**
**පානලුව සණස**





# සමස්ථ ලංකා තරඟාවලියේ

## ප්‍රථම ස්ථානය



2019 වර්ෂයේ සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමය මගින් පවත්වන ලද ළමා සාහිත්‍ය ඇගයීමේ සමස්ථ ලංකා තරඟාවලියේ

කථික තරඟයෙන් ප්‍රථම ස්ථානය

ලබාගත් මකුළුදූව-නාම්පමුණුව, පලිගෙදර, කොරකපිටිය සණස අනුබද්ධ ටිකිරි ළමා සමාජයේ

**නෙළුම් ලෝදිනි දියණියට අපගේ සුභාශිංසණය**

**ගරු කාරක සභාව, කාන්තා කමිටුව, සියලුම අනු කමිටු, සණස කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත සාමාජික සාමාජිකාවන්**

අකාලයේ මිලිනව ගිය උද්‍යාන රන් කැකුළු ළමා සමාජයේ

**සචින්ත මාලන් සොයුරාට-පුතුට**

## නිවන් සුව පතමු.



*රන් කැකුළු ළමා සමාජයේ වසර කීපයක් සභාපති තනතුර දැරූ කොළඹ මහානාම විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි හදිසි අනතුරකින් සදහටම අපෙන් සමුගත්*

**සචින්ත මාලන් සෙනෙහෙ බර සොයුරාණනි, පුතණුවනි**

ලබන්නාවූ වෙනත් ආත්මයකදී මෙවන් අකල් මරණයකට ගොදුරු නොවී අප අතරම ඉපදේවායි පතන්නේ සදා සොවින් තැවෙන රන් කැකුළු ළමා සමාජයේ සොයුරු, සොයුරියන් සහ උද්‍යාන සණස සමිතියේ නැන්දලා හා මාමලා

**ප්‍රසාද් විජේවර්ධන - උද්‍යාන වාර්තාකරු**

## දස පෙරුම් දම්

නව වසර 2020 ආරම්භට සියලු බොදුනුවන් විසින් පුරුදු පුහුණු කළ යුතු ගුණධර්ම 'පාරමී' හෙවත් 'දස පෙරුම් දම්' ලෙස දාන පාරමිතාව සිට උපෙක්ෂා පාරමිතාව තෙක් මාසයෙන් මාසයට ජනවාරි සිට එළි දැක්වේ.

වසර දහයක් පුරා කවියෙන් ගෙනා 'ජාතක කතා පොතෙන්' 2019 දෙසැම්බර් මාසයෙන් අවසන් කළ බව, පාඨක ඔබට දැනුම් දෙමු.

## දාන පාරමිතාව

කරුණා ගුණෙන් නුවණින් සිය දිවි　　රකිනා
පරිහරණින් උපකරණද　　අත්හරිනා
අලෝභයෙන් සිත මුදනා සැප　　හරිනා
පාරමී දම් පළමු පෙළ දානය　　වෙමිනා

බුදුබව පතන බුදුවරු වෙත　　මුල්වන්නේ
දානය උසස් වී පළවෙනි තැන　　ගන්නේ
දෙලොවට හේතුවන මංගලයකි　　දන්නේ
සංග්‍රහ සතර වස්තුවෙ පෙරමුණ　　ගන්නේ

ආයු, වණ්ණ, සැප, බල, පඥා,　　පහකී
දන්දෙනු තැනැත්තේ සිත පහදනු　　යෙහෙකී
සඟුණද, දෙමාපියණද, සිල්වත්　　රැසකී
අනුගත දීම, පූජා අනුකම්පා　　දෙකකී

'අනුරුදු' තෙරුන් දැක සිඟපත්　　යදින්නා
තමබත් පතින් එක හැන්දක්　　පුදන්නා
'ඉන්දික' සුරපතිව බලවත්　　දෙවන්නා
දන් පිං පල මෙයින් දිස්වේ　　සොයන්නා

ආමිස, අභය, දම්, තෙවදැරුම්　　දාන
අතරින් ඉස්මතුව එන්නේ දම්　　දාන
පාරමී තුනකි පිරිනමනා පරමත් උප　　දාන
පුරමු අපිත් පාරමී දම්, හැර ලොබ, දී　　දාන

*-හේමසිරි බෙනරගම-*



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු**
**මෙන්ම**
**භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂවරයකු වූ**

# සංගමයේ සභාපතිගෙන්

ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සමිතියක ගොඩනැගිල්ලක් කුලියට ගෙන ඇති අයෙකුට කාරක සභික ධුරයකට පත්විය හැකි ද?

**පිළිතුර** : නොහැකිය. සමිතිය සමග මුදල් ගනුදෙනුවක් වන නිසා ය. පුද්ගලයා සමග හෝ පුද්ගලයාගේ බිරිද හෝ සමීපතමයකු මගින් හෝ ඔහු හෝ ඔහුගේ පවුලේ අය ඊට සම්බන්ධනම් නුසුදුසුය. එවැනි අවස්ථාවක දී සමිතියේ වාසියට එම ගනුදෙනු හෝ මුදල තීරණය කිරීමේ දී බාධාවක් වීම ද නිසා මෙම ව්‍යාපාර කටයුත්තකට සම්බන්ධ අයකු ලෙස සැලකිය යුතු බැවිනි

**ප්‍රශ්ණය** : සාමාජිකයකුගේ දරුවකු සමිතියෙන් මුදල් ලබා ගන්නා සේවාවක යෙදෙන විට කාරක සභාවට තෝරා ගත හැකි ද?

**පිළිතුර** : නොහැකිය. තමාගේ දරුවකු පවුලේ අයෙකු සමිතියෙන් මුදල් ලබා ගන්නා සේවාවක නිරත නම් සමිතියේ වැටුපක්, ගාස්තුවක් ලෙස මුදල් ගනුදෙනුවක් ඔහුගේ පවුලේ අය සිදු කරයි. ඒ නිසාම ඔවුන්ගේ සේවාවල ඌනතාවයක්, වරදක් නොදකිනාසේම, සේවා ගාස්තු තීරණය කිරීමේ දී සිය පවුලේ අයගේ වාසියට තීරණය වන බව සාමාජිකත්වයේ විශ්වාසයයි. පවුලට සමිතිය මගින් ආදායමක් ලැබීම නිසා එවැනි අය පත් කිරීම නුසුදුසුය.

## දෙලොව අභිවෘද්ධිය සලසාගැනීමට

## ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙන් ලැබෙන පිටුවහල

මෙලොව ජීවත්වන සෑම කෙනෙකු ම ඉතා හොඳ ජීවිතයක් ගතකිරීමට කැමැත්තාහ. සියළුම ආගම් මගින් ආචාර ධර්ම පද්ධතියක් නිර්දේශ කර ඇත. චරිත ශුද්ධිය - පරාර්ථ සේවනය ශීලාචාර ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය කරන ගුණදර්ම ආගම් මගින් දේශනාකර ඇත. එසේම තම ජීවිතයට අවශ්‍ය, යහපත් පැවැත්මට අවශ්‍ය උපදෙස් ආගම් දර්ශන මගින් හදුනා ගත හැක. අප ගෞතම බුදු රජාණන්වහන්සේ ශ්‍රේෂ්ඨතම ශිෂ්ඨාචාරය ගොඩනැංවූ උත්තමයා යයි කීම නිවැරදිය. බුදු දහම එලොව මෙලොව යන උබයාර්ථ ලෝකයම යහපත් කරගෙන සියළුම දුක්වලින් නිදහස්ව ලබ සදාකාලික සුවය සලසාගන්නා ආකාරය ඉතා මැනවින් දේශනාකර ඇත. එක් අතකින් බෞද්ධ දර්ශනය ඉතා සාර්ථක ම ජීවන දර්ශනයකි. සමගිය - සහජීවනය - සමානාත්මතාව - සියළු සමාජ සාරධර්ම බුදුදහම තුල මැනවින් දේශනා කර ඇත. සදාචාර අංශයේ මෙම සියළුම ගුණදර්ම ඇතුළත්ව ඇත. ස්වාමි- භාර්‍යා යුතුකම් හා වගකීම් මව් පිය දු දරු යුතුකම් හා වගකීම ගුරු සිසු වගකීම සේව්‍ය සේවක වගකීම් හා යුතුකම් ස්වාමි, සේවක යුතුකම් හා වගකීම් ආදී සෑම සමාජ අංශයක් පිළිබදව ම බුදු දහමෙන් ලබාදී ඇත්තේ ඉතා ඉහළ ඉගැන්වීමකි.

මෙම ඉගැන්වීම් පිළිබඳව ඉතා ඉහළ දැනුමක් ලබා ගැනීමට සිගාලෝවාද සූත්‍රය - ධම්මික සූත්‍රය - අචීවෙන්ති සූත්‍රය - සංවාස සූත්‍රය - මහා මංගල සූත්‍රය - තමෝතම සූත්‍රය ආදී සූත්‍ර පරිශීලනය කිරීමෙන් හැකියාව ලැබෙයි.

මෙහිදී ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ඉගැන්වෙන මෙලොව අභිවෘද්ධියට හේතු වන කරුණු සතරක් පිළිබඳව සුළු විමසීමක් කිරීමට අදහස් කරමි. දිනක් බුදුපියාණන් හමුවට පැමිණෙන දීඝජානු කොලිය පුත්‍රයෙක් බුදුපියාණන් වහන්සේගෙන් විමසා සිටියේ මෙවන් පැනයකි. 'ස්වාමීනි, අප පස්කම් සැප අනුභව කරන කාමයෝගී ගිහියෝය. අපට ද මොලොව - පරලොව සැප අවශ්‍යය. මෙලොව - පරලොව සැප දෙන කරුණු පහදා දෙන ලෙස ඉල්ලා සිටිමි' යනුවෙනි. මෙහිදී බුදුපියාණෝ කොලිය පුත්‍රයාට මෙලොව අභිවෘද්ධිය සලසන කරුණු සතරක් සහ පරලොව යහපත සලසන කරුණු සතරක් දේශනා කළ සේක. මෙහිදී ගිහි කාමභෝගී ජීවිතයක් සාර්ථක කරගැනීමට පිහිට වන කරුණු සතර පිළිබඳව සුළු විමසීමක් කරමි. උට්ඨාන සම්පදා - ආරක්ඛ සම්පදා - කල්‍යාණ මිත්තතා - සමජීවිකථා යනු ඒ කරුණු සතරයි.

පසු කලාපයට


**ජයපාල විජේරත්න**
**වැලිවිට මාලබේ සණස**

*සණස කරගම්පිටිය සැරසුව*
*　　ගරු සභාපති ලෙසිනි　　කාරිය*
*නැණැස ඔහුගෙනි නියමු අසුනේ*
*　　පෙරටමයි නොනවතින　　වීරිය*
*සනසමින් මුළු ගමක සෙනෙහස*
*　　විඳින විට ඒ වෙහෙස　　මීරිය*
*වෙනස, කවුරුත් නොවේ මැතිඳුනි*
*　　ඔබයි　　ඩැනිසන් වීරසූරිය*

*මනස පැටලිලිය ණය බර　　වැළපිලිය*
*සණස සැලකිලිය ලද විට　　සැනසිලිය*
*වෙනස පැහැදිලිය යන මග　　සැනකෙළිය*
*නැණස කළඑළිය 'සණසයි'　　සඳඑළිය*

*ණය ගන්න කොට කවුරුත්　　පොරකාය*
*එතකොට සණස පැණි වෑහෙන　　වරකාය*
*ණය ටික ගෙවන්නට කිව්වොත්　　නරකාය*
*එතකොට සණස 'කළු කැත ගඳ ගොරකාය'*

**ආනන්ද කොහොත**
**කළුබෝවිල හත්බෝධිය සණස සාමාජික**





1 පිටුවෙන්...

## ධන බලය හා නිල බලය...

තොර බිස්නස් එකක් පමණක් බවට පත්වීම වෙනස් කිරීම අත්‍යාවශ්‍යව තිබේ.

රටතුල ලියාපදිංචිවී ඇති ක්‍රියාත්මකවන 13000 කට වැඩි සමුපකාර සංවිධාන සාමාජිකයින්ගේ බවට පත් කොට සාමාජික ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට මෙන්ම ඒවායේ ස්වාධීනත්වයද ඇතිවන අන්දමට ශක්තිමත් මහජන සංවිධාන බවට පත් කිරීමෙන් සිදුවන්නේ සිය ජීවන ගැටලු විසදා ගැනීම සදහා ඔවුන් විසින්ම එක්ව කටයුතු කිරීමට අවස්ථාව සලසා දීමය. මේ වන විට සමිති 8000 ක් පමණ වන සකසුරුවම් හා ණයගනුදෙනු සමිති අදටත් සාමාන්‍ය ජනතාවට බැංකු වලින් ලබා ගන්නා ණය වලට වඩා සහන පොලී යටතේ□ සහසුවෙන් ණය ලබා දීමට පවුල් දසලක්ෂයක් පමණ ඒක රාශී වී ඇති සමිති සමිතිබවට පත්ව තිබේ. ඒවා මසකටවරක් සියලුම සාමාජිකයින් රැස්වෙමින් සිය අභිවෘද්ධිය සදහා ක්‍රියාත්මක වීමේ ඇති වටිනාකම තේරුම්ගෙන නැත. මන්ද ඔවුන්ගේ සේවාවවන් ප්‍රචලිත කිරීමක් නැති බැවිනි. ඊට අමතරව වෙනත් කේෂ්ත්‍ර වල සමුපකාරවලින් ජනතාවට සලසන සේවා අමිල වූ එකකි. මෙය රජයට ද පහසුවක් ඇති කරයි.

**සමුපකාර රටතුල සිදුකළ හැකි බලපෑම තේරුම් ගැනීම සදහා 2015 වර්ෂයේ නිකුත්ව ඇති සංඛ්‍යාන සංග්‍රහය අනුව දත්ත කිහිපයක් මෙසේ දක්වමි.**

| | |
|---|---|
| ලියාපදිංචි සමිති සංඛ්‍යාව | 13,650 |
| සාමාජික සංඛ්‍යාව | 8,418,268 |
| සමුපකාර සේවා නියුක්තිය | 45,802 |
| 2015 දී සමුපකාර මිලදීගත් භාණ්ඩවල වටිනාකම | රු. 86,586,690,000 |
| 2015 මෙහෙයුම් ආදායම | රු. 129,169,430,000 |
| 2015 ආයෝජන ආදායම හා වෙනත් ආදායම් | රු 12,961,680 |
| 2015 ශුද්ධ ලාභය | 4,336,120,000 |
| 2015.12.31 ට සමුපකාර මුලු වත්කම් | රු. 338,907,140,000 |
| 2015 වර්ෂයේ තැන්පත් | රු. 13,589,476,000 |
| 2015 වර්ෂයේ දුන් ණය | රු. 7,851,253,000 |

1 පිටුවෙන්...


## දියගම සණසෙන් පාසැල් උපකරණ

පිරිනැමීමද, සකසුරුවම් මාසයේදී ඉතුරුම් කැටවලට වැඩිම මුදලක් ඒකරාශීකරණය කරන ලද ළමා ගිණුම් හිමි ප්‍රථම ස්ථානය ලබාගත් නිමේෂ් සදීප රණසිංහ, දෙවන ස්ථානය ලබාගත් තනුරි කවිත්මා ප්‍රනාන්දු, තෙවන ස්ථානය ලබාගත් ඉසුරු මතීෂ ධීරනාත් යන දරු දැරියන්ට ත්‍යාග හා ඉතුරුම් කැට ලබාදීමද

සණස සමිති සාමාජිකයින්ගේ ඉතුරුම් කැටවලට වැඩිම මුදලක් ඒකරාශීකරණය කර ප්‍රථම ස්ථානය ලබාගත් ඕෂදී ලක්ෂානි මෙනවියට, දෙවන ස්ථානය ලබාගත් ජී. පේමවතී මහත්මියට, තෙවන ස්ථානය ලබාගත් විනීතා වීරසූරිය මහත්මියට ත්‍යාග හා ඉතුරුම් කැටද ප්‍රධාන ආරාධිතයින්ගේ සුරතින් පිරිනැමින.

මීට අමතරව ඉතුරුම් කැටවලට මුදල් ඒකරාශිකරනය කරන ලද ළමා සාමාජිකයින් සියලු දෙනාට ත්‍යාගයක් සමග ඉතුරුම් කැටයක් ලබාදීමද ඉතුරුම් කැට වලට මුදල් ඒකරාශීකරනය කරන ලද සණස සමිති සාමාජික සියළු දෙනාට නව ඉතුරුම් කැටලබාදීමද සිදු කෙරින.

දියගම සණස සමිතියේ ගරු සභාපති ඩී. අමරතුංග මහතාගේ හා ගරු උපසභාපති ප්‍රේමසිරි වීරසූරිය මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත කාරක සභිකයින් බැංකු කාර්යය මණ්ඩලය විසින් මෙම උත්සවයේ වැඩකටයුතු සංවිධානය කලහ.



කොළඹ දිස්ත්‍රික් හෝමාගම කලාපීය අධ්‍යක්ෂ එම්. ලයනල් ගුණරත්න මහතාගේ සුරතින් දරුවන්ට පාසැල් පොත් හා පාසැල් උපකරණ ලබාදීම.

චමිලා ජයතුංග - දියගම සණස ලේකම්

## සීල සමාදාන හා භාවනා වැඩසටහන



පසුගියදා ශ්‍රී සුධර්ශනාරාම පුරාණ මහා විහාරස්ථානයේ අනුශාසකත්වයෙන් සී.ස. නැගෙනහිර මාලබේ සණස මන්දිරයේදී සීල සමාදාන හා භාවනා වැඩසටහන සාර්ථකව පැවැත්වූහ. පූජ්‍ය වේරදුවේ මහින්ද ස්වාමීන් වහන්සේ, පූජ්‍ය සෙවනගල සමාධි ස්වාමින්වහන්සේ සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතා ගිහි දේශනයක් පැවැත්වූහ.

පිට්ටුගල ශ්‍රී සුධර්ශනාරාම විහාරාධිපති මංගල ස්වාමින්වහන්සේ ධර්ම දේශනයක්ද සිල් පවාරණ කටයුතුද සිදු කරනු ලැබූහ. අවුරුදු පතා කරන ශිල භාවනා වැඩසටහන සාමාජික පිරිස, ගම්වාසීන්, එකතුව පැවැත්වනු ලැබූහ. සණස සභාපතිතුමා, නිලධාරී මණ්ඩලයද, කාර්ය මණ්ඩලයද ශිල භාවනා වැඩ සටහනට සහභාගි වූහ.

**අනුලා පෙරේරා**



## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2020 පෙබරවාරි 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :- තෙවැදෑරුම් දානයන් නම් කරන්න?**

### කූපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 11**

**ඒ. ගාමිණී සරත්චන්ද්‍ර මහතා**

### කූපන් අංකය 01

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................

පිළිතුර: ..........................................................

..........................................................

## සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


එල්. ප්‍රනාන්දු


පි. රාජපක්ෂ


බී.එච්. ආරියවති


එච්. සිල්වා


එල්. ප්‍රනාන්දු


ප්‍රමිතා සාගරි


එම්. වික්ටෝරියා


ජී. අයිරාංගනි


ඊ.ඒ. ඩොලිනෝනා


ආර්. වෙත්තසිංහ


ඒ. පෙරේරා


සී. කුමාරි


එච්. කුසුමාවති


දිල්හානි චමිලා


ඒ. කුමුදුනි


ජේ. ජැන්සන්


ජේ. එලිසබෙත්


එල්. මල්ලිකාආරච්චි


දිමුතු චාමර


එන්. මෙන්ඩිස්


ජේ. ප්‍රනාන්දු


ඒ. සුවාරිස්


උෂාන් තිළිණ


එම්. උදයාංගනි


කෝසල පසිදු

# සී.ස. බටුවන්දර එකමුතු සණස
# 22 වන සංවත්සරය සැමරූ වගයි

සී.ස. බටුවන්දර එකමුතු සමිතියේ 22 වන සංවත්සර මහා සභාව පසුගිය සැප්තැම්බර් මස 29 වන දින සමිති ශාලාවේදී උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

සංවත්සරය සදහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ දිස්ත්‍රික් සමුපකාර සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතාද සෙසු ආරාධිත අමුත්තන් ලෙස ජඹුරලිය සමිතියේ සභාපති ප්‍රසන්න පෙරේරා මහතා සහ භාණ්ඩාගාරික, වෑතර රිලාවල සමිතියේ සභාපති මාකන්දන පර්ෂද සභාපති සේනාරත්න ෂෙල්ටන් මහතා, හොන්නන්තර උතුර සමිතියේ සභාපති අබේරත්න මහතා, සී.ර. බටුවන්දර සමිතියේ උප සභාපති රත්නපාලි යන අයද සහභාගී වූහ.

සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතා සමිතියේ ප්‍රගතිය සම්බන්ධව සතුට පල කරමින් හරවත් දේශනයක් පැවැත්වූ අතර මෙත් මල් ළමා සමාජයේ දරුවන්ගේ නර්තන අංගයන්ගෙන් සභාව ප්‍රබෝධමත් විය. සියලුම සාමාජිකයන්ටද ළමා ගිනුම් හිමියන්ටද නර්තනය ඉදිරිපත් කල සියලු දරුවන්ටද ත්‍යාග බෙදා දීමෙන් අනතුරුව සභාපතිතුමිය විසින් පැමිණි සියලු දෙනාටම විශේෂ ස්තුතියක්ද පුද කරන ලදී.

1996 වසරේදී බටුවන්දර එකමුතු සණස සමිතිය ආරම්භ වුවද එය ලියාපදිංචි ස.ණ.ස. සමිතියක් බවට පත්වුයේ 1997 වසරේදීය. ආරම්භයේදී මෙහි සාමාජික සංඛ්‍යාව දස දෙනෙකුටත් අඩු අගයක පැවතිණි. එලෙස ඇරඹු ගමන් මගේදී ප්‍රදේශවාසීන්ගේ විශ්වාසය ක්‍රමයෙන් දිනා ගනිමින් අද වන විට ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව සියයකට ආසන්න සංඛ්‍යාවක් දක්වා වර්ධනය කරලීමට ලැබීම සතුටට කරුණකි. සී.ස. බටුවන්දර එකමුතු සණස කාර්යාලය පිහිටුවීම සදහා සංගමයෙන් පූර්ණ මැදිහත්වීමක් සහිතව ඉඩමක් මිලදී ගැනීම, අංග සම්පූර්ණ සණස කාර්යාලය හා රැස්වීම් ශාලාව ඉදිකිරීම ආදිය සිදුවු වැදගත් කාර්යයන්ය. මෙලෙස වසර 22ක් පුරාවට අප සමිතිය බටුවන්දර ග්‍රාමය තුල කැපී පෙනෙන, එලදායී සමිතියක් බවට පත්වී තිබේ.



සභාපතිණිය විසින් පිරිකර පූජා කිරීම



ඉදිරිපත් කිරීම වෙනුවෙන් ත්‍යාග ලබමින්

### 2019 -2020 වසරේ නව නිලධාරි මන්ඩලය

**ගරු සභාපති :**
ආර්.ඒ. චන්ද්‍රකාන්ති

**ගරු උපසභාපති :**
එච්.එච්. නන්දසිරි

**ගරු ලේකම් :**
ඒ. ඉමල්ෂා ප්‍රසාති

**ගරු භාණ්ඩාගාරික :**
කේ. ඡායා චන්ද්‍රානි

**ගරු කාරකසභික :**
බී.එස්. නිලන්ති,
කේ.ඒ. ශ්‍රියානි,
නලින් පුෂ්පකුමාර

**විගනන නිලධාරී :**
සමන්තා මංජුලා,
ඉෂිරා හංසනී



ආරාධිත අමුත්තන් හා සාමාජිකයින්



වැඩිම තැන්පත් හිමි ළමා ගිනුම් සදහා ත්‍යාග පිරිනැමීම



ළමා සමාජයේ දූ දරුවන්



සාමාජික සාමාජිකාවන්



ගරු සභාපතිනිය සමග කාරක සභාව

ඉමාෂා - ලේකම් බටුවන්දර සණස